# 10 ශ්‍රේණිය ඉතිහාසය

# ක්‍රියාකාරකම් පත්‍රිකාව



## ඒකකය 4

## ශ්‍රී ලංකාවේ පැරණි සමාජය







# ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

## • නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න

01.පත්තිනි දේවාලයක් විවෘත කිරීමට දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට ගිය ලංකාවේ ලම්බකර්ණ වංශික රජතුමා මින් කවුරුන්ද?

1. වසභ රජු 2. I ගජබාහු රජු 3. යසලාලක තිස්ස රජු 4. උපතිස්ස රජු

02.පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකු සමග විවාහ සබඳතාවක් ගොඩ නගා ගත් I වන විජයබාහු රජුගේ සොහොයුරිය කවුරුන්ද?

1. තිලෝකසුන්දරී .2 සංඝමිත්තා 3. මිත්තා 4. අනුලා

03.ශ්‍රී ලංකාව සරන්ඩිබ් යනුවෙන් හඳුන්වා ඇති දැනට සොයාගෙන ඇති පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය මින් කුමක් ද?

1. අල් - මස්ලික්වාල් - මමාලික් 2. අජායිබ් අල් - හින්ද්
3. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය 4. ඉබන් බතූතාගේ වාර්තා

04. ත්‍රිපිටකයට අටුවා රචනා කළ විදේශික හිමිනම ඇතුළත් පිළිතුර කුමක්ද?

1. බුද්ධඝෝෂ හිමි 2. මහානාම හිමි 3. පාහියං හිමි 4. හියුන්සාං හිමි

05.ක්‍රි.ව 9 වන සියවසේ විසූ ආරාබි ජාතික ඉතිහාසඥයෙක් වූ අල් බලසුරි රතු කැට දිවයින ලෙස හඳුන්වා ඇත්තේ,

1. සවුදි අරාබිය 2. ඉරාකය 3. ශ්‍රී ලංකාව 4. ඉන්දියාව

06.පොහොය දිනවල වෙළෙඳාම් කළ අයට දඩ නියම කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය මින් කුමක්ද?

1. මිහින්තලා පුවරු ලිපිය 2.වේවැල්කැටිය ශිලා ලිපිය
3. ගල්පොත ශිලා ලිපිය 4. සොරබොරවැව ටැම් ලිපිය

07.විහාර ආරාමවලට කරන ලද පූජාවන් ගැන තොරතුරු ඇතුළත් ශිලාලිපිවල විවිධ සංකේත භාවිතා කර ඇත. එහි හංසයා නිරූපණය කෙරෙන සංකේතයෙන් හැඟවෙන්නේ කුමක්ද?

1. සෞභාග්‍යය 2. පාරිශුද්ධත්වය 3.ආරක්ෂාව 4.පූර්ණත්වය

08.අතීතයේ බොහෝ වෙළෙන්දෝ වෙළඳ සමූහ වශයෙන් සංවිධානය වී කටයුතු කරන ලදී. එවැනි වෙළෙඳ සමූහ හඳුන්වා ඇත්තේ කෙසේ ද?

1. අබල වපර නමිනි 2. වණිජ නමිනි 3. නියමස්ථාන නමිනි 4. කාල සුමන නමිනි

09. ශ්‍රී ලංකාවට බහු වාර්ගික, බහු ආගමික මෙන් ම විවිධ සංස්කෘතීන්ට අයත් රටක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,

1. දූපතක් වශයෙන් පිහිටීම ය. 2.ස්වභාවික සම්පත් ඇති රටක් වීම ය.
3.සැපවත් දේශගුණයක් සහිත රටක් වීම ය. 4.ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය.

**10.** මහාවංශ ටීකාවේ සඳහන්වන ආකාරයට බ්‍රාහ්මණයින් ආගමික කටයුතු කරන ගොඩනැගිල්ල හඳුන්වා ඇති පිළිතුර තෝරන්න.

**1.** පණ්ණශාලා **2.** සිවිකාශාලා **3.** පධානඝර **4.** සොත්ථිශාලා

**11.** අතීත ශ්‍රී ලංකාවේ වගා කන්න තුනක් පැවති බවට සාධක හමුවේ. තුන්වැනි කන්නය වගා කිරීම තීරණය වූයේ,

**1.** ගම් නායකයාගේ අභිමතය පරිදි ය. **2.** පසුගිය කන්නයේ ලැබූ අස්වැන්න මත ය

**3.** ගොවීන්ගේ උනන්දුව මත ය. **4.** ජලය ලබා ගැනීමේ හැකියාව පරිදි ය.

**12.** අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිතා කළ නාමය,

**1.** සෙයිලාන් ය **2.** තප්‍රොබේන් ය **3.** සෙරන්ඩිබ් ය **4.** තම්බපණ්ණි ය

**13.** කැති අඩ , කෙටු කනබ අය ලෙස සෙල්ලිපිවල දක්වා ඇත්තේ කුමක්ද?

**1.** ගොවිතැනේදී භාවිතා කළ උපකරණ දෙකකි.

**2.** හෙන් ගොවිතැනේදී අය කළ බදු වර්ග දෙකකි.

**3.** රජු යටතේ සිටි නිළධාරින් දෙදෙනෙකි.

**4.** රජ කාලයේ දුන් දඩුවම් දෙකකි.

**14.** පහත සඳහන් ප්‍රකාශ අතරින් වෙළඳ මධ්‍යස්ථාන පිළිබඳව සඳහන් වන ප්‍රකාශ තෝරන්න.

A - සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපියක 'වාපර' නමින් සියඹලා වෙළෙන්දෙකු හඳුන්වා ඇත.

B- එකල පැවති සමූහ වෙළඳ සංවිධාන 'පූගය' හෙවත් 'නියමස්ථාන' නමින් හඳුන්වා ඇත.

C- සොරබොර වැව ටැම් ලිපියේ හෝපිටිගම වෙළඳපොළ විස්තර කර ඇත.

D- නානාදේසි වෙළඳ සංවිධානයට අයත් මුද්‍රාවක් අනුරාධපුරයෙන් සොයාගෙන ඇත.

**1.** A B **2.** B D **3.** B C **4.** C D

**15.** අතීතයේ විවිධ වෘත්තීන් වල නියැලුන අය පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. ඒවායින් නිවැරදි ප්‍රකාශය තොරන්න.

A-සිත්තරුන් සදිවිහරිය නමින් හඳුන්වා ඇත.

B- නිති විශාරදයෝ 'වොහාර' ලෙස හඳුන්වා ඇත.

C- ගුරුවරුන් භාණකවරු නමින් හඳුන්වා ඇත.

D- සෙල්ලිපි වල වෛද්‍යවරු 'වෙජ' නමින් හඳුන්වා ඇත.

**1.** A B **2.** B D **3.** B C **4.** C D

**16.** පුරාණ රජවරුන්ගේ පාලන කාලයේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය ලෙස ක්‍රියාත්මක වූයේ මින් කුමක් ද?

**1.** අධිකරණය **2.** පාර්ලිමේන්තුව **3.** වෙජ්ජසාලා **4.** රාජසභාව

**27.** අතීතයේ ලංකාව "රතුකැට දිවයින" නමින් හඳුන්වා ඇත්තේ කුමන ජාතිකයන් ද?

**1.** බ්‍රිතාන්‍ය ජාතිකයන් **2.** ලන්දේසි ජාතිකයන්

**3.** පෘතුගීසි ජාතිකයන් **4.** අරාබි ජාතිකයන්

**28.** පහත I කොටසේ දැක්වෙන ස්ථාන හෝ ආයතන අතීතයේ භාවිතා කළ නාමයන් II කොටසින් තෝරා අදාළ පිළිතුර ගලපන්න.

| I කොටස | II කොටස |
|---|---|
| **1.** ගැබිනි මව්වරුන්ගේ මාතෘ නිවාස | A එක්කැන්සමිය |
| **2.** සෞඛ්‍ය පහසුකම් සහිත රෝහල් | B වෙජ්ජසාලා |
| **3.** රාජාණ්ඩු ක්‍රමය යටතේ සැකසුණු රාජ සභාව | C උපසග්ග රෝගනාස |
| **4.** උණ රෝගීන් සඳහා ඉදිකළ විශේෂ රෝහල | D පසවන්තිනාම |
| | E සොත්තිශාලා |

**1.** D B A C **2.** A E C B **3.** B D C A **4.** D E C B

**29.** ශ්‍රී ලංකාව සිය අසල්වැසි රටවල් සමග පැවැති සම්බන්ධය අතර විවාහ සම්බන්ධතා ද සිදුවිය. ඒ අතර කාලිංග දේශය සමග පැවැත්වූ විවාහය පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?

**1.** විජය කුමරු විජායි කුමරිය විවාහ කර ගැනීම.
**2.** පළමුවන විජයබාහු රජතුමා තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගැනීම.
**3.** මිත්තා කුමරිය විදේශ කුමරෙකුට විවාහ කර දීම.
**4.** පඬුවස්දෙව් රජු භද්දකච්චායනා කුමරිය විවාහ කර ගැනීම.

**30.** ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට අනුව මෙරට වඩාත් පැරණිම ගොවිතැන් ක්‍රමය වනුයේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

**1.** කුඹුරු ගොවිතැන **2.** හේන් ගොවිතැන **3.** ගොඩ ගොවිතැන **4.** වතුවගාව

- **පහත ඡායාරූපය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**



a. **පහත සඳහන් ඡායාරූපයන් හඳුනාගෙන නම් කරන්න.**
සෙල් ලිපියක්

b. **එහි දැක්වෙන බලු කපුටු සලකුණින් කුමක් නිරූපනය වේද?**
මෙහි සඳන් දීමනාවට බාධා කළ අය මතු ආත්මයේ බල්ලන්ව උපදින බව

c. **එහි වැලැක්මෙන් දැන්වෙන සලකුණින් නිරූපිත සත්වයා කුමක්ද?**

**හංසයා**

d. **එහි සඳහන් අඩ සඳ සලකුණෙන් ප්‍රකාශිත අදහස කුමක්ද?**

**ඉර හඳ- දීමනාව ඉර හඳ පවතිනතාක් පවතින ලෙස ලබාදුන් දීමනාවක් බව**